# NAPLAN Online – දෙමාපියන් සහ රැකබලා ගන්නන් සඳහා වන තොරතුරු

2021

## ඔබේ දරුවා NAPLAN පරීක්ෂණවලට ඔන්ලයින් පෙනී සිටියි

සිසුන් සඳහා වඩාත් ආකර්ෂණීය, වඩාත් හොඳ වඩාත් නිවැරදි අගැයීමක් ලබා දීම පිණිස සියලුම පාසල් ක්‍රමානුකූලව වර්තමාන පන්ති පාදක NAPLAN සිට NAPLAN Online වෙත මාරු වීම සඳහා ෆෙඩරල්, ප්‍රාන්ත සහ පළාත් අධ්‍යාපන ඇමතිවරු එකඟතාව පළ කළහ.

ප්‍රාන්ත සහ දේශභූමි අධ්‍යාපන බලධාරීන් ඔවුන්ගේ පාසල් ඔන්ලයින් වෙත හැරෙන්නේ කවදා දැයි තීරණ කරති. වර්තමාන සැලැස්ම වන්නේ 2022 වන විට සියලුම පාසල් NAPLAN Online වෙත මාරු වීමටයි.

NAPLAN Online එක් ප්‍රධාන වාසියක් වන්නේ සකස් කරන ලද (හෝ අනුවර්තන) පරීක්ෂාවක් මගින් සිසුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව ඉහළ හෝ පහළ සංකීර්ණතාවෙ යුතු ප්‍රශ්න ඉදිරිපත් කිරීමයි.

සැකසූ (හෝ අනුවර්තන) පරීක්ෂණ කිරීම සැලසුම් කර ඇත්තේ පුළුල් පරාසයක ශිෂ්‍ය හැකියා තක්සේරු කිරීමට සහ ශිෂ්‍ය සාධනය වඩාත් නිවැරදිව මැනීමටය. ප්‍රශ්න වෙනදාට වඩා අභියෝගාත්මක යැයි ඔබේ දරුවා සිතන්නේ නම් එය සැලකිල්ලට නොගත යුතුය; ඔවුන් වඩාත් සංකීර්ණ පරීක්ෂණ මාවතක යමින් සිටිය හැක. ශිෂ්‍යයෙකුගේ සමස්ත NAPLAN අගය පදනම් වන්නේ ඔවුන් නිවැරදිව පිළිතුරු දෙන ප්‍රශ්න ගණන හා සංකීර්ණත්වය මතය.

## සිසුන් NAPLAN සඳහා පෙනී සිටින්නේ ඇයි?

ජාතික තක්සේරු වැඩසටහන - සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මකතාව (NAPLAN) විසින් තක්සේරු කරනු ලබන්නේ සෑම දරුවෙකුටම පාසල හා ජීවිතය තුළින් දියුණුවීමට අත්‍යවශ්‍ය සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මකතාව.

අවුරුදු 3, 5, 7 හා 9 යන වසරවල සිසුන් කියවීම, ලිවීම, භාෂා සම්මුති (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ හා විරාම ලකුණු) සහ සංඛ්‍යාත්මකතා වාර්ෂික NAPLAN පරීක්ෂණ සඳහා සහභාගී වේ.

තක්සේරුව මාපියන්ටත් පාසල්වලටත් පරීක්ෂණ සිදු කරන වේලාවේදී එක් එක් සිසුන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් දෙයි. NAPLAN යනු පාසලේ තක්සේරු කිරීමේ සහ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයක් පමණි - එය සිසුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ගුරුවරුන් විසින් කරනු ලබන අඛණ්ඩ ඇගයීම් වෙනුවට යොදා ගත නොහැක.

අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය සහ තරුණ ඕස්ට්‍රේලියානුවන් සාක්ෂරතාවේ සහ සංඛ්‍යාත්මකතාවයේ වැදගත් අධ්‍යාපන ප්‍රතිඵල අත්කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ තොරතුරු NAPLAN විසින් පාසල්, අධ්‍යාපන බලධාරීන් සහ රජයන් වෙත සපයනු ලබයි.

## NAPLAN අගයන්නේ මොනවාද?

සිසුන්ගේ නිත්‍ය පාසල් විෂය මාලාව තුළින් සිසුන් ඉගෙන ගන්නා සාක්ෂරතාව සහ සංඛ්‍යාත්මකතාව NAPLAN විසින් අගයනු ලබයි. NAPLAN විෂය කරුණු සංවර්ධනය කිරීම සඳහා සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන අධ්‍යාපන බලධාරීන් දායක වී ඇත.

සිසුන් ඔන්ලයින් හෝ ලිඛිතව පරීක්ෂණ සම්පූර්ණ කළත් නොකළත්, එකම සාක්ෂරතාව සහ සංඛ්‍යාමකතාව පිළිබඳ එකම විෂයමාලා අන්තර්ගත මත සිසුන් අගැයීම කරනු ලැබේ. ආකෘති දෙකෙහිම ප්‍රතිඵල එකම NAPLAN අගැයීම් පරිමාණය මගින් වාර්තා කළ හැකිය.

NAPLAN Online ගැන වැඩි විස්තර දැනගැනීම සඳහා nap.edu.au වෙත පිවිසෙන්න

## මගේ දරුවාට උපකාර කිරීමට මට කුමක් කළ හැකිද?

NAPLAN තනිවම ඉගෙන ගෙන කළ හැකි පරීක්ෂණයක් නොවන අතර සිසුන් එසේ කිරීමට අපේක්ෂා නොකරයි.

NAPLAN යනු ඔබගේ දරුවාගේ පාසල් වැඩසටහනේ එක් කොටසක් පමණක් බව සහතික කිරීමෙන් සහ ඔවුන්ගේ දවසේ වැඩ කොටස උපරිමයෙන් කිරීමට ඔවුන්ට මතක් කිරීමෙන් ඔබට ඔබේ දරුවාට සහය විය හැකිය.

NAPLAN සඳහා අධික ලෙස සූදානම් වීම හෝ පුහුණුව සපයන්නන්ගෙන් සේවය ලබා ගැනීම ACARA නිර්දේශ නොකරයි.

සිසුන්ට උපාංග භාවිත කිරීම පිළිබඳ හුරුපුරුදු බව, ඒවායේ ටයිප් කිරීම සහ වැඩසටහන් තුළ සැරිසැරීම සිසුන්ගේ ඉගෙනීමේ කොටසක් වන බවත් එය පාසලේ පළමු වසරේ සිට ඕස්ට්‍රේලියානු අවශ්‍යතාවක් බවත් සහතික කිරීම.

NAPLAN Online යනු යතුරුපුවරු කුසලතා පරීක්ෂණයක් නොවේ. ශිෂ්‍යයෙකුට කෙතරම් වේගවත්ව හා හොඳින් අතින් අකුරු ලිවිය හැකි ද යන්නෙහි වෙනස්කම් මෙන්ම, කෙතරම් වේගවත් හා හොඳින් යතුරු ලීවීම කිරීමෙහි ද වෙනස්කම් තිබේ 3 වසර සිසුන් පරීක්ෂණය ලිඛිතව සම්පූර්ණ කරති.

විභාගවල ඇති ප්‍රශ්න වර්ග සිසුන්ට හුරුපුරුදු බව ගුරුවරුන් විසින් සහතික කරනු ලබන අතර සුදුසු සහාය සහ උපදෙස් දෙනු ලැබේ.

NAPLAN Online අගැයීම්වල ඇති ප්‍රශ්න වර්ග සහ අදාළ ක්‍රියාකාරකම් බැලීමට nap.edu.au/online-assessment/public-demonstration-site වෙත පිවිසෙන්න.

## NAPLAN සඳහා සහභාගී වීම

අවුරුදු 3, 5, 7 හා 9 යන වසරවල සියලුම සිසුන් වාර්ෂික NAPLAN අගැයීමට සහභාගී වන බව අපේක්ෂා කෙරේ පන්ති කාමර ඇගයීම් වෙනුවෙන් සාමාන්‍යයෙන් ලබා දෙන සහයෝගය පිළිබිඹු වන සීරුමාරු කිරීම් සඳහා ආබාධිත සිසුන්ට සුදුසුකම් ලැබිය හැකිය. ඔබේ දරුවා සඳහා කිසියම් සීරුමාරු කිරීමක් ගැන ඔබේ දරුවාගේ ගුරුවරයා සමඟ ඔබ සාකච්ඡා කළ යුතුය.

අගැයීමට සහභාගී වීමේ හැකියාව බොහෝ සෙයින් සීමා සහිත වූ ආබාධිත ශිෂ්‍යයෙකුට හෝ මෑතකදී ඕස්ට්‍රේලියාවට පැමිණි, ඉංග්‍රීසි කථා නොකරන ඉංග්‍රීසි කථා නොකරන පසුබිමක් ඇති සිසුවෙකුට විධිමත් නිදහස් කිරීමක් ලබා දිය හැකිය.

විශේෂ විධිවිධාන හෝ විධිමත් නිදහස් කිරීමක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලිය පිළිබඳ වැඩි විස්තර ලබා දීමට ඔබේ පාසලේ විදුහල්පතිවරයාට සහ ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරියට පුළුවනි.

## මගේ දරුවා NAPLAN දිනවල පාසල් නොයන්නේ නම්?

හැකි සෑම විටකම, පරීක්ෂණ කරන අවස්ථාවේ නොපැමිණෙන සිසුන් සඳහා මඟ හැරුණු පරීක්ෂණ එම පරීක්ෂණ සතියේම වෙනත් අවස්ථාවක සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කිරීමට පාසල්වලට පුළුවනි.

## NAPLAN Online කාල සටහන

පොත්පත් පරීක්ෂණය සඳහා ලබා දී ඇති දින තුන වෙනුවට NAPLAN Online සඳහා අගැයීම රාමුව දින නවයකි. මෙය සැලසුම් කිරීමේ දී පාසල්වලට නම්‍යශීලී බවක් ලබා දීම සහ අඩු උපාංග ඇති පාසල් සඳහා පහසුකම් සැපයීම සඳහාය.

NAPLAN Online අගැයීම් රාමුව මැයි 11 වන අඟහරුවාදා ආරම්භ වන අතර 2021 මැයි 13 වන සිකුරාදා අවසන් වේ.

ඔන්ලයින් පරීක්ෂණ සැලසුම් කිරීමේ අවශ්‍යතා පහත වගුව තුළ විස්තරාත්මකව දක්වා ඇත

## මගේ දරුවාගේ කාර්ය සාධනය වාර්තා වී ඇත්තේ කෙසේද?

එක් එක් අගැයීම සඳහා තනි තනි ශිෂ්‍ය කාර්ය සාධනය ජාතික සාධන පරිමාණයෙන් පෙන්වනු ලැබේ. ජාතික අවම ප්‍රමිති ප්‍රතිඵලයකින් පෙනී යන්නේ ශිෂ්‍යයා එම වර්ෂයේ මට්ටමට පූර්ණ ලෙස සහභාගී වීමට අවශ්‍ය මූලික සාක්ෂරතා සහ සංඛ්‍යාත්මකතා කුසලතා පෙන්නුම් කර ඇති බවයි.

ඔබේ දරුවාගේ NAPLAN තනි ශිෂ්‍ය වාර්තාව වර්ෂයේ පසු භාගයේදී පාසල විසින් නිකුත් කරනු ලැබේ. ඔබට වාර්තාවක් නොලැබුනේ නම්, ඔබ ඔබේ දරුවාගේ පාසල ඇමතිය යුතුය.

## NAPLAN ප්‍රතිඵල භාවිත කරන්නේ කෙසේද?

- ගුරුවරුන් සමඟ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා තනි තනි ප්‍රතිඵල භාවිත කිරීමට ශිෂ්‍යයින්ට සහ දෙමාපියන්ට පුළුවනි.
- මහත් අභියෝග හෝ අමතර ආධාරවලින් ප්‍රතිලාභ ලබන සිසුන් වඩා හොඳින් හඳුනා ගැනීමට ගුරුවරුන් විසින් ප්‍රතිඵල භාවිත කරනු ලැබේ.
- ඉගැන්වීමේ වැඩසටහන්වල ශක්තිය සහ ඒවායේ වැඩිදියුණු කළ යුතු තැන් හඳුනා ගැනීම, සහ සාක්ෂරතා හා සංඛ්‍යාත්මකතා ඉලක්ක පිහිටු වීම සඳහා පාසල් විසින් ප්‍රතිඵල භාවිත කරනු ලබයි.
- වැඩසටහන් සහ පාසල්වලට ලබා දුන් සහය සමාලෝචන කිරීම සඳහා පාසල් විසින් ප්‍රතිඵල භාවිත කරනු ලබයි.
- සාමාන්‍ය පාසැල් NAPLAN ප්‍රතිඵල myschool.edu.auදැක ගැනීමට ප්‍රජාවට පුළුවනි.

## මට වැඩි විස්තර ලබා ගත හැක්කේ කොතැනින්ද?

NAPLAN පිළිබඳ වැඩි විස්තර සඳහා:

- ඔබේ දරුවාගේ පාසල අමතන්න
- ඔබේ ප්‍රාදේශීය පරීක්ෂණ පරිපාලන අධිකාරිය nap.edu.au/TAAඔස්සේ අමතන්න
- පිවිසෙන්න nap.edu.au

NAPLAN සඳහා පුද්ගලික තොරතුරු ACARA විසින් හසුරුවනු ලබන ආකාරය දැන ගැනීමට, nap.edu.au/naplan/privacyවෙත පිවිසෙන්න.

| පරීක්ෂණය | අවශ්‍යතා සැලසුම් කිරීම | කාල සීමාව | පරීක්ෂණ විස්තරය |
|---|---|---|---|
| **ලිවීම** | 3 වසර සිසුන් ලිඛිත ලිවීමේ පරීක්ෂණයක් (1 වන දින පමණක්) සිදු කරයි<br><br>5 වන වසර 1 වන දින ආරම්භ විය යුතුය (1 හා 2 දිනවල පමණක් ලිවීම සම්පූර්ණ කිරීමට පාසල් ප්‍රමුඛතාව දිය යුතුය)<br><br>7 හා 9 වසර 2 වන දින ආරම්භ විය යුතුය (2 හා 3 දිනවල පමණක් ලිවීම සම්පූර්ණ කිරීමට පාසල් ප්‍රමුඛතාව දිය යුතුය) | 3 වසර: විනාඩි 40 යි.<br>5 වසර: විනාඩි 42 යි.<br>7 වසර: විනාඩි 42 යි.<br>9 වසර: විනාඩි 42 යි. | 'ලිවීමේ උත්තේජනයක්' (සමහර විට එය 'පෙළඹවීමක්' - අදහසක් හෝ මාතෘකාවක් ලෙස හැඳින්වේ) සහ විශේෂිත ප්‍රභේදයක (කතාන්තරයක් හෝ ඒත්තු ගැන්වීමක්) ප්‍රතිචාරාත්මක ලිවීමක් සිසුන්ට දෙනු ලැබේ |
| **කියවීම** | ඔන්ලයින් පාසල්වලට NAPLAN පරීක්ෂණ සම්පූර්ණ කළ හැකි බව සහතික කිරීම සඳහා දින-නවයේ පරීක්ෂණ කවුළුව තුළ, අවුරුදු 7 හා 9 සිසුන්ට 1 වන දින කියවීමෙන් ආරම්භ කළ හැකිය; කෙසේ වෙතත්, නැවත සැලසුම් කළ ඕනෑම දෙයකට වඩා ලිවීමේ පරීක්ෂණය ප්‍රමුඛතාව ගන්නා බැවින් 2 වන දින ලිවීම ආරම්භ කළ යුතුය. පළමු දින සිට පරීක්ෂණ කියවීම<br><br>භාෂා පරීක්ෂණයේ සම්මුතිවලට **පෙර** සම්පූර්ණ කිරීම සඳහා | 3 වසර: විනාඩි 45 යි.<br>5 වසර: විනාඩි 50 යි.<br>7 වසර: විනාඩි 65 යි.<br>9 වසර: විනාඩි 65 යි. | සිසුන් විසින් තොරතුරු, පරිකල්පනීය හා ඒත්තු ගැන්වෙන වගන්ති රාශියක් කියවා අදාල ප්‍රශ්නවලට පිළිතුරු සපයනු ලබයි. |
| **භාෂාවේ සම්මුති** | කියවීමේ පරීක්ෂණයෙන් **පසු** සම්පූර්ණ කිරීම සඳහා | 3 වසර: විනාඩි 45 යි.<br>5 වසර: විනාඩි 45 යි.<br>7 වසර: විනාඩි 45 යි.<br>9 වසර: විනාඩි 45 යි. | මෙම පරීක්ෂණය අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු අගැයීම සිදු කරයි |
| **සංඛ්‍යාත්මකතාව** | භාෂා සම්මුති පරීක්ෂණයෙන් **පසුව** සම්පූර්ණ කිරීම සඳහා | 3 වසර: විනාඩි 45 යි.<br>5 වසර: විනාඩි 50 යි.<br>7 වසර: විනාඩි 65 යි.<br>9 වසර: විනාඩි 65 යි. | මෙම පරීක්ෂණය මගින් සංඛ්‍යා සහ වීජ ගණිතය, මිනුම් සහ ජ්‍යාමිතිය, සහ සංඛ්‍යාලේඛන සහ සම්භාවිතාව අගයනු ලැබේ |